# ජෛවීය ද්‍රව්‍ය වෙත ප්‍රවේශය හා ප්‍රතිලාභ සාධාරණ හා යුක්ති සහගත ලෙස බෙදාහදා ගැනීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

**පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය**

1. **ප්‍රතිපත්ති නාමය:**
**ජෛවීය ද්‍රව්‍ය වෙත ප්‍රවේශය හා ප්‍රතිලාභ සාධාරණ හා යුක්ති සහගත ලෙස බෙදාහදා ගැනීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය**

2. **බලාත්මක දිනය:**

**3. හැඳින්වීම**

**I. පසුබිම**

ශ්‍රී ලංකාව, භෞමික හා ජලජ (මිරිදිය හා කිවුල්දිය) ප්‍රදේශ සහ එහි බල ප්‍රදේශයට අයත් නාවුක ජලතීරය තුල පවතින ඉතා සාරවත් භෞමික, වගුරුබිම්, වෙරළබඩ සහ සමුද්‍රීය ජෛවවිවිධත්වයකට තෝතැන්නක් බව ජාත්‍යන්තර ලෙස ප්‍රකටය. සපුෂ්ප ශාක, මත්ස්‍ය වර්ග, උභය ජීවීන්, උරගයින් හා ක්ෂීරපායින් සම්බන්ධයෙන් ඒකක ක්ෂේත්‍රඵලයක් තුළ ඇති ජීවී විශේෂ විවිධත්වය අතින් ආසියාතික රටවල් අතර ප්‍රථම ස්ථානය ගන්නා අප රට ලොව අන් කිසිදු තැනක හමු නොවන බොහෝ ආවේණික විශේෂ අතින් පොහොසත්ය. ශ්‍රී ලංකාවේ දේශීය සපුෂ්ප ශාකවලින් 28% ක් සහ දේශීය පෘෂ්ඨවංශීන් අතරින් 42% ක් මෙරටට ආවේණික වන අතර, මේ වන විට විශ්ලේෂණය කර ඇති, ගොඩබිම් ගොළුබෙල්ලන් හා මිරිදිය කකුළුවන් වැනි, අපෘෂ්ඨවංශී සත්ව කණ්ඩායම් අතර ආවේණිකත්වය 80% ඉක්මවයි. දිලීර, පහත් ශාක හා සමහර ක්ෂුද්‍රජීවී කණ්ඩායම් අතරද ඉහළ විශේෂ විවිධත්වයක් ඇති බවට විශ්වාස කෙරේ. මෙමගින් පෙනී යන්නේ ශ්‍රී ලංකාව සුවිශේෂී හා පොහොසත් දේශීය ජෛවවිවිධත්වයකට උරුමකම් කියන බවයි. එමෙන්ම ශතවර්ෂ ගණනාවක් මුළුල්ලේ කෘෂිකර්මාන්තයෙහි නිරත ගොවීන් විසින් සිදු කරනු ලැබූ බෝග තෝරා ගැනීම හා ප්‍රභේද වැඩිදියුණු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස පාරම්පරික ප්‍රභේද හා භූමි දර්ශ ඇතුලත්ව පුළුල් පරාසයක බෝග විවිධත්වයක් රට තුල ඇතිවී තිබේ. මෑත කාලීනව හිතකර ලක්ෂණ සහිත බොහෝ නව බෝග ප්‍රභේදයන් නිපදවා ඇත. සාම්ප්‍රදායික ගොවිපළ සත්ව වරිග (Farm animal breeds) ගණනාවක් ශ්‍රී ලංකාව සතුවන අතර නිෂ්පාදකතාවය වැඩිකිරීමේ අරමුණින් එම සත්ව වරිගවල ජාන යොදාගනිමින් දෙමුහුන් වරිග නිපදවා ඇත. මෙම සියළු ක්‍රම මගින් වාණිජ හෝ වාණිජ නොවන පරමාර්ථ සඳහා භාවිතා කරනු ලබන පුළුල් පරාසයක දේශීය ජෛව සම්පත් අප සතුව ඇත. ජාන සම්පත් ඇතුළුව ශ්‍රී ලංකාවේ පොහොසත්වූ ජෛවවිවිධත්වය මෙරට ආර්ථික සංවර්ධනය සඳහා වැදගත් වන අතර, විශේෂයෙන්ම දේශගුණ විපර්යාසයන්හි බලපෑම් හමුවේ ආහාර සුරක්ෂිතතාව, යහපත් සෞඛ්‍යය, පෝෂණය හා යහපැවැත්ම සුරක්ෂිත කිරීමේ වත්මන් හා අනාගත අවශ්‍යතා සපුරාලීමේ විභවය එමගින් ලැබී ඇත.

ශ්‍රී ලංකාව, ජෛවවිවිධත්ව සම්මුතියේ (Convention on Biological Diversity- CBD) පාර්ශවකරුවකු වශයෙන් එම සම්මුතියේ පළමු අරමුණු ද්විත්වය වන ජෛව විවිධත්වය සුරැකීම හා තිරසර ලෙස භාවිතා කිරීම ප්‍රවර්ධනය කරයි. ඒ අනුව මෙරට ජෛවවිවිධත්වය ස්ථානීයව හා පරිභාහිරව සංරක්ෂණය කිරීම සඳහා බොහෝ ප්‍රතිපත්ති හා නීති රීති තිබේ. ජෛවීය ද්‍රව්‍ය වෙත ප්‍රවේශය හා ප්‍රතිලාභ සාධාරණ හා යුක්ති සහගත ලෙස බෙදාහදා ගැනීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, ජෛවවිවිධත්ව සම්මුතියේ 15 වන වගන්තිය මගින් පිළිබිඹු වන සම්මුතියේ තුන්වන අරමුණ ඉලක්ක

කර ඇත. සම්මුතියේ 15 වන වගන්තියේ අරමුණ වන්නේ ජානමය සම්පත් අතින් පොහොසත් වූ ජානමය සම්පත් ලබාදීමේ විභවයක් සහිත පාර්ශව රාජ්‍යයන්ට දේශීය ජෛව සම්පත් සුරැකීම සඳහා ආධාර කිරීමයි. මෙය සිදු කරනුයේ ජානමය සම්පත් පරිහරණය කිරීමට බලාපොරොත්තු වන අනෙකුත් පාර්ශව රාජ්‍යයන් සමග ජෛව සම්පත් පරිහරණයෙන් ලැබෙන ප්‍රතිලාභ සාධාරණ හා යුක්ති සහගත ලෙස බෙදා හදා ගැනීමට අදාලවන ගෙවීම්, තාක්ෂණික හුවමාරුව, ධාරිතා වර්ධනය, පර්යේෂණ දැනුම හුවමාරුව, රාජ්‍ය භාග ගෙවීම් හා නිසි පිළිගැනීම ආදී අවශ්‍ය සම්බන්ධතා ගොඩ නගා ගැනීම තුලිනි.

1999 දී පිළියෙල කරනු ලැබූ 'ශ්‍රී ලංකාවේ ජෛවවිවිධත්ව සංරක්ෂණ ක්‍රියාකාරී සැලැස්ම' (Biodiversity Conservation in Sri Lanka- A Framework for Action -BCAP) තුළ ප්‍රථම වරට ජාන සම්පත් වෙත ප්‍රවේශය හා ප්‍රතිලාභ බෙදා හදා ගැනීම පිළිබඳව කරුණු ඉදිරිපත් කර ඇත. ඉන් පසු මෙම සංරක්ෂණ ක්‍රියාකාරී සැලැස්මට අතිරේකයක් පිළියෙළ කරනු ලැබූ අවස්ථාවේ දී මේ පිළිබඳව තත්ත්ව විශ්ලේෂණයක්ද සිදු කරන ලදී. පසුව පරිසර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ ජාතික ධාරිතා වර්ධන අවශ්‍යතා ස්වයං-තක්සේරුව (National Capacity Need Self Assessment) නමැති ව්‍යාපෘතිය හරහා 2006 වර්ෂය තුළ දී මේ පිළිබඳව සිදු කළ පූර්ණ විශ්ලේෂණයෙන් ඵලදායී ලෙස ජාතික ජාන සම්පත් වෙත ප්‍රවේශය හා ප්‍රතිලාභ සාධාරණ හා යුක්ති සහගත ලෙස බෙදාහදා ගැනීම් සඳහා වූ ක්‍රියාමාර්ග, යාන්ත්‍රණ, ක්‍රියාත්මක කිරීමේ ව්‍යුහය සහ ධාරිතා අවශ්‍යතා හඳුනාගනු ලැබීය. තවද මෙහිදී මෙම ක්‍රියාදාමය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාවයද පෙන්වා දී ඇත. 2016-2022 කාලපරිච්ඡේදය සඳහා වූ ශ්‍රී ලංකාවේ ජාතික ජෛවවිවිධත්ව උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්මෙහිද ජාන සම්පත් වෙත ප්‍රවේශය හා ප්‍රතිලාභ බෙදා හදා ගැනීම පිළිබඳව කටයුතු කිරීමේ අවශ්‍යතාව පෙන්වා දී ඇත. පසුකාලීනව, ජානමය සම්පත් පමණක් සැලකිල්ලට ගැනීම වෙනුවට මෙරට ජෛවීය ද්‍රව්‍ය ආවරණය කිරීමේ අවශ්‍යතාවය හා එබඳු ද්‍රව්‍යවල ප්‍රයෝජනය හා භාවිතය පිළිබඳ සම්ප්‍රදායික දැනුම දරන්නන්ගේ අයිතිවාසිකම් පිළිගැනීම හා සුරක්ෂිත කිරීමේ අවශ්‍යතාවයන්ද ඉස්මතු විය.

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව රට සතු ජෛවීය ද්‍රව්‍ය පිළිබඳ පරමාධිපත්‍ය ශ්‍රී ලංකාව සතුවේ. ජෛවීය ද්‍රව්‍ය වෙත ප්‍රවේශය හා ප්‍රතිලාභ බෙදාහදා ගැනීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට වඩාත් අදාළ වන අනෙකුත් ජාතික ප්‍රතිපත්තීන් හා නීති ඇමුණුම 1 මගින් ඉදිරිපත් කර ඇත.

### II. අවශ්‍යතාව

ශ්‍රී ලංකාව සිය ජෛවවිවිධත්වය සංරක්ෂණය කිරීමට හා ජෛව සොරකම හා ජෛව මංකොල්ලය වැළැක්වීමට ක්‍රියාමාර්ග යොදා ඇති නමුදු එබඳු අපහරණයන් තවමත් අඛණ්ඩව සිදු වේ. මෙම තත්ත්වයන් වැළැක්වීම සඳහා ශ්‍රී ලංකාවේ ජෛවීය ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත සාම්ප්‍රදායික දැනුම භාවිතා කිරීමේ හැකියාව සහිත සියළු පරිහරණය කරන්නන් සම්බන්ධයෙන් සඵලදායී ලෙස කටයුතු කරනු පිණිස පැහැදිළි ජාතික ප්‍රතිපත්ති, උපායමාර්ග හා යාන්ත්‍රණ ගොඩනැගීම මෙන්ම ඊට අදාළ ධාරිතා සංවර්ධනය කිරීමද අවශ්‍යය. එවැනි පරිහරණය කරන්නන් ලෙස රට තුළ ක්‍රියාකරන්නන්,

ජෛවවිවිධත්ව සම්මුතියේ පාර්ශව රාජ්‍යයන් හා පාර්ශව නොවන රාජ්‍යයන් මෙන්ම එම රටවල් තුළ වූ ස්වභාවික හා නෛතික පුද්ගලයන්ද ඇතුලත් වේ.

තවද ජෛවවිවිධත්ව සම්මුතියේ 15 වන වගන්තිය සලකා බලනුයේ (a). සම්මුතියේ පාර්ශව රාජ්‍යයන්හි සම්භවය වූ ස්ථානීය ජාන සම්පත් සහ (b). එම රාජ්‍යයන් සම්මුතියට අනුකූලව අත්පත් කරගත් ජාන සම්පත් පිළිබඳව පමණක් වේ. එම නිසා ශ්‍රී ලංකාවේ ජෛවීය ද්‍රව්‍ය වෙත ප්‍රවේශය හා ප්‍රතිලාභ සාධාරණ හා යුක්ති සහගත ලෙස බෙදාහදා ගැනීමේ ක්‍රමවේදය, ජෛවවිවිධත්ව සම්මුතිය තුලට ගැනෙන හා නොගැනෙන ජෛවීය ද්‍රව්‍ය ආවරණය වන ලෙසට නියාමනය කළ යුතු අතර ඒ සඳහා පූර්ව දැනුම්දීමකින් ලබාගන්නා අනුමැතිය (Prior Informed Consent) හා අන්‍යෝන්‍ය ලෙස එකගවූ කොන්දේසි’ (Mutually Agreed Terms) යන මූලධර්ම භාවිතා කළ යුතු වේ. තවද, ජෛවීය ද්‍රව්‍ය වෙත ප්‍රවේශය මගින් ජානමය සම්පත් වෙත ප්‍රවේශය පමණක් ආවරණය නොවිය යුතු අතර එයට ජානමය සම්පත් ලෙස භාවිතා කිරීමේ විභවයක් ඇති නාමකරණය සඳහා නිදර්ශක වශයෙන් රටෙන් පිටතට යවනු ලබන ද්‍රව්‍ය ආදියද ඇතුලත් විය යුතුය. මේ අනුව ජානමය සම්පත් වෙත ප්‍රවේශය හා ප්‍රතිලාභ බෙදාහදා ගැනීමේ යාන්ත්‍රණයේදී සලකා බැලිය යුතු වැදගත් කරුණු දෙකක් ලෙස “පූර්ව දැනුම්දීමකින් ලබාගන්නා අනුමැතිය” හා “අන්‍යෝන්‍ය ලෙස එකගවූ කොන්දේසි” වැදගත් වේ.

ජාතික ජෛවීය ද්‍රව්‍ය වෙත ප්‍රවේශය හා ප්‍රතිලාභ සාධාරණ හා යුක්ති සහගත ලෙස බෙදා හදා ගැනීමේ ජාතික ප්‍රතිපත්තිය රටේ ජෛවවිවිධත්වය හා ජෛවීය ද්‍රව්‍ය පිළිබඳ රාජ්‍යයට ඇති පරමාධිපත්‍ය පිළිගත යුතුවේ. ශ්‍රී ලංකාවට සිය ජෛවීය ද්‍රව්‍ය සංරක්ෂණය කිරීමට හා තිරසර ලෙස භාවිතා කිරීමටත්, මෙරට ජෛවීය සම්පත් හා ආශ්‍රිත සාම්ප්‍රදායික දැනුම වෙත ප්‍රවේශය පාලනය කිරීමටත් ඇති අයිතිවාසිකම් සුරකිය හැකි හා එබඳු ද්‍රව්‍ය භාවිතයෙහි ප්‍රතිලාභ සර්ව සාධාරණ ආකාරයෙන් බෙදාහදා ගැනීමේ හැකියාව ලබාදෙන ක්‍රියාකාරී නෛතික රාමුවක් අවශ්‍ය වේ. දැනට රටේ ඇති නෛතික රාමුව, පූර්ව දැනුම්දීමකින් ලබාගන්නා අනුමැතිය හා අන්‍යෝන්‍ය ලෙස එකග වූ කොන්දේසිවලට අනුකූලවීමට ප්‍රමානවත්ය. නමුත් දැනට ඇති නීතීන් නිසි ලෙස ක්‍රියාත්මක නොවීම හා ඇතැම් ජෛවීය සම්පත් ආවරණය කිරීමට රෙගුලාසි නොමැතිකම හේතුවෙන් ජෛවීය ද්‍රව්‍යවලට නීති විරෝධී ප්‍රවේශය සිදුවේ. ජාතික ජෛවීය ද්‍රව්‍ය වෙත ප්‍රවේශය හා ප්‍රතිලාභ සාධාරණ හා යුක්ති සහගත ලෙස බෙදා හදා ගැනීම පිළිබඳ යාන්ත්‍රණය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා සාධාරණ හා යුක්ති සහගත ලෙස ප්‍රතිලාභ බෙදා හදා ගැනීම හා අදාළ තාක්ෂණය හුවමාරු කර ගැනීමට අදාළ ආයතන හා පුද්ගලයන් තුල ධාරිතා සංවර්ධනය කිරීම අවශ්‍ය වේ. මෙයට ජෛවතාක්ෂණය සඳහා ධාරිතා ගොඩනැංවීම, සාම්ප්‍රදායික දැනුම දරන්නන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සහ සාධාරණ හා යුක්ති සහගත ලෙස අදාළ බාහිර පාර්ශව රාජ්‍යයන් සහ වෙනත් පාර්ශවකරුවන් සමග ‘ප්‍රවේශය හා ප්‍රතිලාභ බෙදාහදා ගැනීම පිළිබඳව සාකච්ඡා කිරීමට අවශ්‍යවන හැකියාව වර්ධනය කළ යුතු වේ.

## III. අදාළත්වය හා විෂය පථය

i. ශ්‍රී ලංකාවේ ජෛවීය ද්‍රව්‍ය වෙත ප්‍රවේශය හා ප්‍රතිලාභ සාධාරණ හා යුක්ති සහගත ලෙස බෙදාහදා ගැනීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මගින් ජෛවීය ද්‍රව්‍යන්හි ජානමය හෝ ජෛව රසායනික ලක්ෂණ හෝ තොරතුරුමය වටිනාකම සඳහා ඒවා වෙත ප්‍රවේශවීමේ තිරසර ක්‍රමවේදයක් ඇති කරනු ඇත. මෙම ක්‍රමවේදය තුලින් ඕනෑම ජෛවීය ද්‍රව්‍යයක් හා ඒවායේ සංයෝග, නිෂ්පාදන, ව්‍යුත්පන්න හා ඒ ආශ්‍රිත පාරම්පරික දැනුම වාණිජමය භාවිතය, පර්යේෂණ භාවිතය හා වෙනත් රට තුල හා රටින් බැහැරව භාවිතය නියාමනය කිරීම සහ එම ජෛව ද්‍රව්‍ය වල තවදුරටත් සිදු කෙරෙන පර්යේෂණ හා එතුලින් සිදු කෙරෙන නිෂ්පාදනද නියාමනය කිරීම සිදු කරනු ලබයි.

ii. මෙම ප්‍රතිපත්තියෙහි ජෛවීය ද්‍රව්‍ය වෙත 'ප්‍රවේශය' යන්නෙන් ආවරණය වන්නේ කවර හෝ සතකු, ශාකයක්, ක්ෂුද්‍රජීවියකු හෝ වෙනත් ද්‍රව්‍යයක ජානමය හෝ ජෛව-රසායනික ලක්ෂණ හෝ ආශ්‍රිත තොරතුරුමය අගය සඳහා වාණිජමය පරිහරණය හා වෙනත් භාවිතයන් සඳහා ඒවා වෙත ප්‍රවේශයවීම වේ.

## IV. අභිප්‍රාය හා සන්දර්භය

මෙම ජාතික ප්‍රතිපත්තිය, ජානමය සම්පත් හා ඒවායේ ව්‍යුත්පන්න ඇතුළු ජෛවීය ද්‍රව්‍ය හා ඒවා ආශ්‍රිත සාම්ප්‍රදායික දැනුම, පර්යේෂණාත්මක හා වාණිජමය භාවිතය ආවරණය කරයි. එය නිර්මාණය වී ඇත්තේ රටේ ජෛවීය ද්‍රව්‍ය හා සාම්ප්‍රදායික දැනුම භාවිතා කරනු ලබන අවස්ථාවන්හිදී ඒවා පරිහරණය කිරීමේදී සාධාරණ හා යුක්ති සහගත ලෙස ප්‍රතිලාභ පිරිනැමීමේ අටියෙන් ඒ සඳහා අවශ්‍යවන නිරවුල් අරමුණු, මූලධර්ම හා කාර්ය පරිපාටිමය විධානයන් දෙනු පිණිසයි. එය අදාළ බුද්ධිමය දේපළ අයිතිවාසිකම් (Intellectual Property Right) සඳහා නිසි අවධානය සහිතව, ජෛවීය සම්පත් භාවිතා කරන නවීන ජෛව-තාක්ෂණවේදය සඳහා ධාරිතාව සංවර්ධනය කිරීම සඳහා උරදෙනු ඇත. මෙම ප්‍රතිපත්තිය පර්යේෂණය, අධ්‍යාපනය හා වාණිජ පරමාර්ථ සඳහා ජෛවීය ද්‍රව්‍ය තිරසර ලෙස පරිහරණය සහතික කරන අතරම, වත්මන් හා අනාගත පරම්පරාවන්වල ප්‍රතිලාභය උදෙසා ජෛවවිවිධත්වය සංරක්ෂණය කිරීමේ ශ්‍රී ලංකා රජයේ ඇපකැප වීමද සහතික කරයි.

## V. තාර්කික පදනම

'ජෛවීය ද්‍රව්‍ය වෙත ප්‍රවේශය හා ප්‍රතිලාභ සාධාරණ හා යුක්ති සහගත ලෙස බෙදාහදා ගැනීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය' සමස්ත ප්‍රතිපත්තියක් වශයෙන් ක්‍රියා කිරීම මගින් ශ්‍රී ලංකාවේ ජෛවවිවිධත්වය සංරක්ෂණය හා තිරසර භාවිතය පිළිබද උනන්දුව ඇති පාර්ශවයන් හා එබදු ජෛවීය ද්‍රව්‍ය වෙත ප්‍රවේශය හා ප්‍රතිලාභ බෙදාහදා ගැනීම පිළිබඳව සම්බන්ධවන තැනැත්තන් මෙම ප්‍රතිපත්තියෙන් බැඳෙනු ඇත.

ශ්‍රී ලංකාවේ ඇති කවර හෝ ජෛවීය ද්‍රව්‍යයක් අවභාවිත කිරීම හෝ වැරදි ලෙස පරිහරණය කිරීම වළක්වමින් ජෛවවිවිධත්වයේ සංරචකයන් වෙත ප්‍රවේශය මගින් පැනනගින ප්‍රතිලාභ සාධාරණ හා යුක්ති සහගත ලෙස ජාතික සංවර්ධන ක්‍රියාවලිය තුළට ලබාදීම මෙම ප්‍රතිපත්තිය මගින් සිදු කෙරෙනු ඇත.

## 4. ප්‍රතිපත්ති පරමාර්ථය

රටේ ජෛවීය ද්‍රව්‍යවල සංරක්ෂණය හා තිරසර භාවිතය වෙත උරදෙනු පිණිස, උචිත මහජන සහභාගිත්වය සහිතව, ජෛවීය ද්‍රව්‍යවල හා ඒ ආශ්‍රිත සාම්ප්‍රදායික දැනුමේ හිමිකාරිත්වය ශ්‍රී ලංකාවේ ජනතාව අතර සුරක්ෂිත කරන අතරතුර, ජෛවීය ද්‍රව්‍ය තිරසරව භාවිත කිරීමෙන් පැනනගින්නාවූ ප්‍රතිලාභ සාධාරණ හා යුක්ති සහගත ලෙස බෙදාහදා ගැනීම සහතික කිරීම.

## 5. ප්‍රතිපත්ති මූලධර්ම

ශ්‍රී ලංකාවේ ජෛවීය ද්‍රව්‍ය වෙත ප්‍රවේශය හා ප්‍රතිලාභ සාධාරණ හා යුක්ති සහගත ලෙස බෙදාහදා ගැනීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය පහත සඳහන් මූලධර්ම මත පදනම් වී ඇත:-

I. ශ්‍රී ලංකාවට සිය රටේ ජෛව සම්පත් සම්බන්ධයෙන් පරමාධිපත්‍යය ඇති අතර ජාතික නීති පද්ධතියට යටත්ව ජෛව සම්පත් වෙත ප්‍රවේශය නිර්ණය කිරීමට හා ඒවා සංරක්ෂණය හා තිරසර ලෙස භාවිතා කිරීමට බලය ඇත.

II. ජෛවීය ද්‍රව්‍යයන්හි ජානමය හෝ ජෛව-රසායනික ලක්ෂණ හෝ තොරතුරුමය අගය සඳහා ඒවා වෙත ප්‍රවේශය පතන කවර තැනැත්තෙක් වුවද, ශ්‍රී ලංකා රජය විසින් ඇතිකර තිබෙන හා මෙම ප්‍රතිපත්තිය යටතේ ආවරණය කරනු ලබන ජෛවීය ද්‍රව්‍ය වෙත ප්‍රවේශය හා ප්‍රතිලාභ බෙදාහදා ගැනීම පිළිබඳ ක්‍රමවේදය පිළිපැදිය යුතුය.

III. ජාන සම්පත් භාවිතයද ඇතුළුව ශ්‍රී ලංකාවේ ජෛවීය ද්‍රව්‍ය සංරක්ෂණය හා තිරසර භාවිතය ආශ්‍රිත සාම්ප්‍රදායික දැනුමේ හා පිළිවෙත්වල වටිනාකම හා වැදගත්කම හඳුනාගෙන ඒවා සුරක්ෂිත කිරීමට කටයුතු කෙරෙනු ඇත.

IV. ජෛවීය ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත සාම්ප්‍රදායික දැනුම පර්යේෂණාත්මක හා වාණිජමය වශයෙන් භාවිතා කිරීමෙන් උත්පාදනය කෙරෙන ප්‍රතිලාභ සාධාරණ හා යුක්ති සහගත ලෙස බෙදාහදා ගැනීම මගින් ඒවායේ සංරක්ෂණය හා තිරසර භාවිතය කෙරෙහි ආර්ථික හා සාමාජීය දිරිගැන්වීම් ලබාදෙන අතර එය වත්මන් හා අනාගත පරම්පරාවන්වල යහපැවැත්මට දායක වනු ඇත.

V. ශ්‍රී ලංකාව සිය ජෛවීය ද්‍රව්‍ය වෙත ප්‍රවේශය ලබාදීමෙන් ලැබෙන ප්‍රතිලාභ සාධාරණ හා යුක්ති සහගත ලෙස බෙදාහදා ගැනීම කෙරෙහි ඇපකැපව සිටින අතර ජෛවීය ද්‍රව්‍යවල ප්‍රයෝජනය අයුතු ලෙස ලබාගැනීම්වලදී ජාතික හා ජාත්‍යන්තර නීති හා ගිවිසුම් හරහා කටයුතු කිරීමේ අයිතිය ශ්‍රී ලංකාව සතුය.

6. ප්‍රතිපත්ති ප්‍රකාශ

I. ශ්‍රී ලංකාව සිය භූමියෙන් ව්‍යුත්පන්න වූ ජීවත්වන හා වඳව ගිය ජීවී විශේෂවල ජානමය ද්‍රව්‍යයන්හි හා ඒවා ආශ්‍රිත සාම්ප්‍රදායික දැනුමේ උපරිම ප්‍රතිලාභ මෙරටට ලැබෙන බවට වග බලාගනු පිණිස ඒවායෙහි වැදගත්කමට හා පරමාධිපත්‍යයට ගරු කරනු ඇත.

II. ජෛවීය ද්‍රව්‍ය තිරසර ලෙස භාවිත කිරීම සඳහා ජෛවීය ද්‍රව්‍ය වෙත ප්‍රවේශය හා ප්‍රතිලාභ බෙදාහදා ගැනීම නියාමනය කරනු පිණිස, උචිත ප්‍රතිපත්තීන්, නෛතික ක්‍රියාමාර්ග, යාන්ත්‍රණ හා ධාරිතා සංවර්ධනය කොට පවත්වා ගෙන යනු ඇත.

III. ජෛවීය ද්‍රව්‍යවලට කවර හෝ පැවරීමක් සිදු විය යුත්තේ ප්‍රවේශය ලබාදීමට බලයලත් රාජ්‍ය නියෝජිතායතනයක් සමග ද්‍රව්‍ය හුවමාරු ගිවිසුමක් හරහා විය යුතු වන අතර ඒ සඳහා පූර්ව දැනුම්දීමකින් ලබාගන්නා අනුමැතිය සහ අන්‍යෝන්‍ය ලෙස එකග වූ කොන්දේසි අත්‍යවශ්‍ය වේ.

IV. ජෛවීය ද්‍රව්‍ය වෙත ප්‍රවේශය ලබාදීමේදී සාධාරණ හා යුක්ති සහගත ප්‍රතිලාභ සහතික කෙරෙනු ඇත.

V. ජෛවීය ද්‍රව්‍යවල වෙළඳපල පාදක යාන්ත්‍රණ භාවිතයද ඇතුළු මූල්‍යමය හා මූල්‍යමය නොවන භාවිතයන් වෙතින් පැනනගින ප්‍රතිලාභ සියලු කොටස්කරුවන් සමග බෙදාහදා ගැනීම සඳහා යාන්ත්‍රණයක් සැකසෙනු ඇත.

VI. බිම් මට්ටමේ ප්‍රජාව සමග ජෛවීය සම්පත් බෙදාහදා ගැනීමට සහ ජෛවවිවිධත්වය හා ඒ ආශ්‍රිත සාම්ප්‍රදායික දැනුම සංරක්ෂණය දිරිගැන්වීමට බහුපාර්ශව, සමෝධානිත ප්‍රවේශයක් / යාන්ත්‍රණයක් ස්ථාපිත කොට ක්‍රියාත්මක කෙරෙනු ඇත.

VII. ජෛවීය ද්‍රව්‍ය වෙත ප්‍රවේශය හා ප්‍රතිලාභ බෙදාහදා ගැනීම සඳහා වූ කාර්ය පටිපාටින්හි දී සාම්ප්‍රදායික දැනුම දරන හෝ භාවිතා කරන ප්‍රාදේශීය ප්‍රජාවන්ද ඇතුළු එම දැනුම දරන්නන්ගේ හා භාවිතා කරන්නන්ගේ අයිතිවාසිකම් හා අවශ්‍යතා මුදුන් පමුණුවනු ලැබේ.

VIII. ජෛවීය ද්‍රව්‍ය වෙත ප්‍රවේශය හා ප්‍රතිලාභ බෙදාහදා ගැනීම සඳහා හවුල්කාරිත්වයන් හා සහයෝගිතාවන්වලට එළඹීමේදී, ශ්‍රී ලංකාවේ වාණිජ අයිතිවාසිකම්ද ඇතුළු සියලු අයිතිවාසිකම් බුද්ධිමය දේපළ අයිතිවාසිකම් මගින් පිළිගැනීමට ලක් කෙරෙන බවට වගබලා ගැනීම මගින් ශ්‍රී ලංකාවට අදාළ බුද්ධිමය දේපළ අයිතිවාසිකම් ගැටළු හා ප්‍රතිලාභයන් ප්‍රමාණවත් ලෙස සලකා බලනු ඇත.

## 7. ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග:

I. ජාතික ජෛවීය ද්‍රව්‍ය වෙත ප්‍රවේශය හා ප්‍රතිලාභ බෙදාහදා ගැනීමේ සඵලදායී ක්‍රියාදාමයක් ඇති කිරීම සඳහා අවශ්‍ය වන කුසලතා පුහුණුව හා ධාරිතා ගොඩනැගීම සඳහා උචිත ආයතනික යාන්ත්‍රණයක් සැකසීම.

II. පවත්නා සියලු නීති රීති භාවිතය හා තවදුරටත් ශක්තිමත් කිරීම මෙන්ම අවශ්‍ය නව රෙගුලාසි ඇති කිරීම මගින් රටේ ජෛවීය ද්‍රව්‍ය වෙත ප්‍රවේශය ලබාදීම හරහා සාධාරණ හා යුක්ති සහගත ප්‍රතිලාභ ලැබීමේ හැකියාව තහවුරු කරනු පිණිස යථාර්ථවාදී මාර්ගෝපදේශ මත පදනම්ව ද්‍රව්‍ය හුවමාරු ගිවිසුම්, පූර්ව දැනුම්දීමකින් ලබාගන්නා අනුමැතිය, ස්වයං නිර්ණ ක්‍රමවේද (Sui Generis Systems) හා ප්‍රතිලාභ බෙදාහදා ගැනීමේ යාන්ත්‍රණ ඇතුලත් අවශ්‍ය නෛතික රාමුව සංවර්ධනය කිරීම.

III. ජාන සම්පත් හා ඒ ආශ්‍රිත සාම්ප්‍රදායික දැනුම පිළිබඳ විස්තර ඇතුලත් සමූහ දත්ත පද්ධතියක් (Meta data system) ස්ථාපිත කිරීම.

IV. ශ්‍රී ලංකාව තුළ සඵලදායී ජාතික ජෛවීය ද්‍රව්‍ය වෙත ප්‍රවේශය හා ප්‍රතිලාභ බෙදාහදා ගැනීම් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සඳහා ආයතනික හා පුද්ගල මට්ටමින් අධ්‍යාපනය, දැනුවත්භාවය හා ධාරිතා වර්ධනය ප්‍රවර්ධනය කිරීම.

V. ජෛවීය ද්‍රව්‍ය වෙත ප්‍රවේශය හා ප්‍රතිලාභ බෙදාහදා ගැනීමේ ක්‍රමවේදයට අදාළ සියලු ක්‍රියාකාරකම් සඳහා නිත්‍ය හා සඵලදායී අධීක්ෂණ හා ඇගයීම් පද්ධතියක් ස්ථාපිත කිරීම.

VI. වගකීම හා අධිකාරිබලය: පරිසරය පිළිබඳ කටයුතු කරන අමාත්‍යාංශය

## 8. පසුවිපරම් හා ඇගයීම

පරිසර විෂයට අදාලව කටයුතු කරන අමාත්‍යාංශය පහත කරුණු සඳහා වගකීම දැරිය යුතුය:

I. ජෛවීය ද්‍රව්‍ය වෙත ප්‍රවේශය හා ප්‍රතිලාභ බෙදාහදා ගැනීම ක්‍රියාත්මක කරනු පිණිස අවශ්‍ය ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට හැකි කේන්ද්‍රීය සම්බන්ධීකරණ ආයතනය වශයෙන් ක්‍රියා කිරීම තුලින් නිවැරදි තීරණ ගැනීම්, නියාමනය හා ඇගයීම තහවුරු කිරීම හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වැනි අනෙකුත් යෝග්‍ය ප්‍රවේශය නිර්ණය කරනු ලබන්නා වූ කේන්ද්‍රීය ආයතන අතර උචිත සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

II. ජාතික ජෛවීය ද්‍රව්‍ය වෙත ප්‍රවේශ හා ප්‍රතිලාභ බෙදාහදා ගැනීමේ ක්‍රමයට බලපෑම් ඇතිවිය හැකි නීති රීති හා ප්‍රතිපත්ති පිළිබඳව අධීක්ෂණය කිරීම.

III. ජෛව සම්පත් වෙත ප්‍රවේශය හා ජෛවීය ද්‍රව්‍ය පරිහරණය සඳහා ලැබෙන ඉල්ලීම් ඒ සඳහා උචිත වගකිවයුතු ආයතන වෙත යොමුකරමින් සමස්ත ප්‍රවේශ හා ප්‍රතිලාභ බෙදාහදා ගැනීමේ ක්‍රියාවලිය පසුවිපරම් කිරීම.

IV. ජෛවීය ද්‍රව්‍ය අපනයනය හා හුවමාරුව පිළිබඳව කටයුතු කරන සියලු ක්‍රියාමාර්ග පිළිබඳ ඇගයීම.

V. ජෛවීය ද්‍රව්‍ය වෙත ප්‍රවේශය හා සම්බන්ධ පෙර දැනුවත් කැමැත්ත හා අන්‍යෝන්‍ය ලෙස ගිවිස ගත් නියමයන් පිළිබඳව ඇගයීම.

VI. ද්‍රව්‍ය හුවමාරු ගිවිසුම් විශ්ලේෂණය කිරීම හා තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා වූ යෝජනා ඇගයීම.

VII. ජෛව ද්‍රව්‍ය මගින් රටට හා සම්ප්‍රදායික දැනුම හා ජෛවවිවිධත්ව සංරචක දරන්නන් වෙත ලැබෙන ඍජු හා වක්‍ර ප්‍රතිලාභ පිළිබඳ පසුවිපරම් කිරීම.

**9. පාරිභාෂික වදන් මාලාව**

**ප්‍රවේශය** යන්නෙන් අදහස් වන්නේ, ශ්‍රී ලංකාවේ ඇති ජෛවීය ද්‍රව්‍ය පවතින්නේ ස්ථානීයව ද පරිභාහිර ස්ථානයක ද යන්න නොතකා, යම් පර්යේෂණයක් සිදු කිරීම සහ/හෝ ජෛවතාක්ෂණය යොදා ගැනීමද ඇතුළු ආකාරවලින් ඒවායෙහි ජානමය සහ/හෝ ජෛව-රසායනික සංයුතිය සංවර්ධනය කිරීම සඳහා මෙන්ම පර්යේෂණ පැවැත්වීම හා සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ජෛව සම්පත්වල ඇති ජානමය හෝ ජෛව-රසායනික ලක්ෂණ හෝ ඒවා ආශ්‍රිත තොරතුරුමය වටිනාකම වාණිජ පරිහරණය හෝ වෙනත් භාවිතයන් සඳහා උපයෝගී කර ගැනීමයි. එසේම ජෛව සම්පත් හා ජාන සම්පත්වල ව්‍යුත්පන්න මත කෙරෙන පර්යේෂණ හා සංවර්ධන කටයුතුද මෙයට අදාළ වේ.

**ජෛවවිවිධත්වය:** භෞමික, සමුද්‍රීය හා වෙනත් ජලජ පරිසර පද්ධති හා ඒවායේ කොටසක් වන සියලු පරිසරවිද්‍යාත්මක සංකීර්ණ ඇතුළු සියලුම මූලාශ්‍ර වෙතින් එන ජීවීන් අතර විචල්‍යතාවයි. ජීවී විශේෂ තුල, ජීවී විශේෂ අතර සහ පරිසර පද්ධතීන්හි දක්නට ලැබෙන විවිධත්වය මෙයට ඇතුළත් ය.

**ජෛවීය සම්පත්**: ජෛවවිවිධත්වයේ සියළු සංරචකයන්ට ඇතුලත් වන්නාවූ මානවයා සඳහා වර්තමාන හෝ විභව්‍ය ප්‍රයෝජනයක් හෝ වටිනාකමක් සහිත ජාන සම්පත් සහ ජීවීන්, ඔවුන්ගේ කොටස්, ජීවීගහනයන් හා පරිසර පද්ධතිවල ඇති අන් කවර හෝ ජෛවීය සංරචක මෙයට ඇතුලත්වේ.

**ජෛවීය ද්‍රව්‍ය:** ජීවී විශේෂ, ජාන සම්පත්, ජීවීන් හෝ ඔවුන්ගේ කොටස්, ජීවීගහනයන් හා අන් කවර හෝ පරිසර පද්ධති තුල ඇති හෝ එයින් පරිභාහිරව සංරක්ෂණය කර ඇති හෝ වෙනත් පරිබාහිර

ස්ථාන තුළ ඇති ජෛව සංඝටක හෝ ජෛවීය කොටස් යන මේවාද ඇතුළු ජෛවවිවිධත්වයේ සංරචක සහ එම ජානමය ද්‍රව්‍යයන්හි ප්‍රතිසංයුක්තයෙන් හා විකරණයෙන් සහ ඍජු භාවිතයෙන් සාදනු ලබන සියළුම ද්‍රව්‍යයන්වේ.

**ජාන සම්පත්:** වර්තමාන හෝ විභව්‍ය වටිනාකමක් සහිත ජානමය ද්‍රව්‍ය (ක්‍රියාකාරී හෝ විභව්‍ය වටිනාකමක් සහිත ප්‍රවේණික ක්‍රියාකාරිත්ව ඒකක අඩංගු කවර හෝ ශාක, සත්ව, ක්ෂුද්‍රජීවී හෝ වෙනත් සම්භවයක් සහිත ජානමය ද්‍රව්‍යද ඇතුළුව)

**ජානමය ද්‍රව්‍ය:** ශාක, සත්ව, ක්ෂුද්‍රජීවි හෝ වෙනත් සම්භවයක් සහිත, ප්‍රවේණික ක්‍රියාකාරිත්ව ඒකක අඩංගු කවර හෝ ජානමය ද්‍රව්‍ය

**ජෛව සම්පත් සංරක්ෂණය:** ජෛවීය සම්පත් වෙත අපට ඇති අයිතියම අනාගත පරම්පරාවන්ටද ඇති බව මනසේ රඳවා ගනිමින්, එම සම්පත් ඒවායේ ආවේනික වටිනාකම වෙනුවෙන් සහ සමාජයේ යහපත උදෙසා ඥානාන්විත ලෙස භාවිතා කිරීම, කළමනාකරණය කිරීම හා ආරක්ෂා කිරීම.

**ජානමය සම්පත්වල මුල් රට:** ස්ථානීයව ජාන සම්පත් සන්තකයේ ඇති රට - මෙයට වනගත මෙන්ම හීලෑ ජීවීන්ගේ ගහනයන් හෝ ශ්‍රී ලංකාවේ සම්භවය ඇති හෝ නැති පරිබාහිර ප්‍රභයන්ගෙන් ලබාගත් හෝ වර්ෂ සියයක් හෝ වැඩි කාලයක් මුළුල්ලේ ස්වභාවීකරණය වී ඇති ගහනයන් ඇතුළත් වේ.

**ව්‍යුත්පන්න:** ජෛවීය හෝ ජානමය සම්පත් තුළ ඒවායේ ප්‍රවේණික ක්‍රියාකාරී ඒකක අඩංගු නොවුවද, ඒවායේ ජානමය භාව ප්‍රකාශය හෝ පරිවෘත්තිය හේතුවෙන් ස්වභාවිකවම ඇති වන ජෛව-රසායනික සංයෝග 'ව්‍යුත්පන්න' යන්නෙන් අදහස් වේ.

**පරිබාහිර තත්ත්වයන්**: ජෛව විවිධත්වයේ සංරචක සිය ස්වභාවික වාසස්ථානවලින් පිටත පැවතීම යන්නයි.

**ස්ථානීය තත්ත්වයන්:** ජෛවීය සම්පත් අදාළ පරිසර පද්ධති හා ස්වභාවික වාසස්ථාන ඇතුළත පැවතීමත්, හීලෑ කරන ලද හෝ රෝපිත ජීවී විශේෂ සම්බන්ධයෙන් වූ කල, සිය ආවේණික ලක්ෂණ වර්ධනය කර ගත් වටාපිටාව තුළ වාසය කිරීමත් යන්නයි.

**තිරසර භාවිතය:** ජෛවවිවිධත්වය දීර්ඝ කාලීනව පරිහානියට පත් වීමට මග නොපෑදෙන ආකාරයකින් හා වේගයකින් ජෛවවිවිධත්වයේ සංරචක භාවිතා කිරීම හා එමගින් වත්මන් හා අනාගත පරම්පරාවල අවශ්‍යතා හා ප්‍රාර්ථනා සපුරාලීමට එහි ඇති විභවය අඛණ්ඩව පවත්වා ගැනීමයි.

**සාම්ප්‍රදායික දැනුම:** විශේෂිත භූගෝලීය ප්‍රදේශයක වාසය කරන ජනතාවගේ සම්ප්‍රදායන් සහ තීක්ෂණ බුද්ධිය තුළින් මතු වූ හා පෝෂණය වූ දැනුම් සම්භාරයයි.

**නිපැයුම් හා තැනුම්:** නිෂ්පාදන ක්‍රියාවලියේදී ජෛවීය ද්‍රව්‍ය භාවිතා කරන කවර හෝ නිෂ්පාදිතයක් අදහස්වේ.

## ඇමුණුම I: ආශ්‍රිත ප්‍රතිපත්ති හා නීති ලේඛනය

**ප්‍රතිපත්ති:**

1. ජාතික වන ප්‍රතිපත්තිය (1995)
2. ජාතික වනජීවී ප්‍රතිපත්තිය (2000)
3. ජාතික පරිසර ප්‍රතිපත්තිය (2003)
4. ජාතික ජලපෝෂක ප්‍රදේශ කළමනාකරණ ප්‍රතිපත්තිය (2004)
5. ජාතික ජෛවසුරක්ෂිතතා ප්‍රතිපත්තිය (2005)
6. ජාතික ධීවර හා ජලජ සම්පත් ප්‍රතිපත්තිය (2006)
7. ජාතික තෙත්බිම් ප්‍රතිපත්තිය හා උපායමාර්ගය (2006)
8. ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය (2007)
9. ජාතික පශුසම්පත් අභිජනන ප්‍රතිපත්තිය (2010)
10. ශ්‍රී ලංකාවේ ආක්‍රමණශීලී ආගන්තුක ජීවීන් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, උපායමාර්ග හා කාර්ය සැලැස්ම (2016)

**නීති:**

1. 1937 අංක 2 දරන වන සත්ව හා වෘක්ෂලතා ආඥාපනත සහ එහි පසු සංශෝධන
2. 1907 අංක 16 දරන වන සංරක්ෂණ ආඥාපනත සහ එහි පසු සංශෝධන
3. 1988 අංක 03 දරන ජාතික උරුම වනභූමි පනත
4. 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත හා එහි සංශෝධන
5. 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනත සහ එහි පසු සංශෝධන
6. 1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනත සහ එහි පසු සංශෝධන
7. 1999 අංක 35 දරන ශාක ආරක්ෂණ පනත හා එහි සංශෝධන
8. 2003 අංක 22 දරන බීජ පනත
9. 1951 අංක 25 දරන පාංශු සංරක්ෂණ පනත සහ එහි පසු සංශෝධන
10. 1958 අංක 29 දරන සත්ව පනත සහ එහි පසු සංශෝධන
11. 1992 අංක 59 දරන සත්ව රෝග පනත
12. 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතන පනත
13. 1992 අංක 46 දරන අපනයන කෘෂිකර්ම ප්‍රවර්ධන පනත
14. 1982 අංක 41 දරන ජාතික සත්වෝද්‍යාන පනත
15. 1928 අංක 31 දරන උද්භිද උද්‍යාන ආඥාපනත සහ එහි පසු සංශෝධන
16. රේගුවෙහි පොදු නියාමනය සඳහා වූ 1869 අංක 17 දරන රේගු ආඥාපනත